සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

# අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)

| 9 ශ්‍රේණිය | ප්‍රායෝගික තාක්ෂණ කුසලතා | කාලය පැය 2 |
|---|---|---|

නම / විභාග අංකය ..........................................................................................................

උපදෙස්

- පාසල තුළ ව්‍යාපෘති සම්බන්ධව කරනු ලබන ප්‍රායෝගිකක්‍රියාකාරකම් සඳහා ලකුණු 20 ක් හිමි වේ
- බහුවරණ ප්‍රශ්න 20 සඳහා ලකුණු 40 ක්ද,
- ව්‍යුහගත ප්‍රශ්න 03 ක් තෝරාගෙන ලිවීමෙන් ලකුණු 40 ක් ලබා දේ.

## I කොටස

01) වර්තමාන කෘෂි ක්ෂේත්‍රයේ ප්‍රධාන ගැටළුවක් බටව පත් වී ඇත්තේ,
1. වගා ඉඩම් සම්බන්ධව පවතින ගැටළුවයි.
2. පොහොර සම්බන්ධව පවතින ගැටළුවයි
3. ජල සම්පාදනය සම්බන්ධ ගැටළුවයි.
4. කොවිඩ් වසංගත තත්ත්වය සම්බන්ධ ගැටළුවයි.

02) එකම බඳුනක පැළ වර්ග කිහිපයක් සිටුවා කට්ටල ලෙස සකස් කිරීමේදී සුදුසු බෝග වර්ගයක් නොවන්නේ,
1. රම්පේ, කරපිංචා
2. බැසිල්, මිංචි
3. කහ, ඉඟුරු
4. පැපොල්, දෙහි

(03) ක්ෂුද්‍රරූපී උද්‍යානයක් සම්බන්ධව වඩාත් නිවැරදි වන්නේ,
1. කොහුබත්වලින් සකසන ලද තවාන් බන්දේසි යොදා ගනියි.
2. විනිවිද පෙනෙන හිස් බෝතල්, මාළු ටැංකි හෝ විසිතුරු වීදුරු බඳුන් තුළ මෙම නිර්මාණ කළ හැකියි.
3. වෙළඳ පොළෙන් විවිධ දෘඪ උපාංග මිලදී ගත යුතුයි.
4. හොඳින් අතු බෙදෙන, කුඩා පත්‍ර සහිත බහු වාර්ෂික ශාක කප්පාදු කරමින් විවිධ හැඩතල නිර්මාණය කළ යුතුය.

04) ජෛව ස්කන්ධ යනු,
1. ශාක හා සත්ව දේහ කොටස් මගින් ඇතිවන කාබනික ද්‍රව්‍ය වේ.
2. රසායනික ද්‍රව්‍ය එක්රැස් වීමෙන් පරිසරයට හානි සිදුවීම වේ.
3. කාබනික දියර පොහොර වර්ගවල එකතුවක් වේ.
4. පරිසරය හානිය වළක්වා ගැනීමට පොලිතින් ප්‍රතිචක්‍රීකරණය කිරීමය.

05) බෝග සමග මිශ්‍රව වගා කළහැකි පළිබෝධ කෘමීන් පලවා හරින ජෛව මර්ධන ශාක ලෙස හැඳින්විය හැක්කේ,
1. ගෝතමාලා, අඩනහිරියා
2. පියුරේරියා, පිපිඤ්ඤා
3. කහ, ඉඟුරු
4. දස්පෙතියා, ආඩතෝඩා

06) පාසල කේන්ද්‍ර කරගත් තාක්ෂණික සේවා අවශ්‍යතා මතුවන ගැටළුමය තත්ත්වයක් ලෙස හැඳින්විය හැක්කේ,
1. පන්ති කාමරයේ දරුවන් අතර ඇතිවන ගැටළුවක්,
2. පාසලේ පානීය ජලනළ පද්ධතියේ පවතින ගැටළුවක්,
3. පාසලේ දරුවන්ගේ පෝෂණමය ගැටළුවක්,
4. දරුවකු දීර්ඝ කාලයක් පාසලට නොපැමිණීම සම්බන්ධ ගැටළුවක්.

(07) වර්තමානයේ වෙළඳපොලේ පවතින විදුලි පහන් කිහිපයක් පහත දැක්වේ. ඒවා නිවැරදිව නම් කර ඇත්තේ,



1. CFL පහන්, LED පහන්, සූත්‍රිකා පහන්
2. LED පහන්, සූත්‍රිකා පහන්, CFL පහන්
3. සූත්‍රිකා පහන්, CFL පහන්, LED පහන්
4. සූත්‍රිකා පහන්, LED පහන්, CFL පහන්

(08) මෑතක් වන තුරු ශීතකරණවල භාවිතා වූ වායු වර්ගවෙනුවට යොදා ගන්නා ඕසෝන් ස්ථරයට හානිකර නොවන පරිසර හිතකාමී වායු මිශ්‍රණ වර්ග නම්,
1. ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන්ය.
2. කාබන් මොනොක්සයිඩ්ය
3. සල්ෆර් ඩයොක්සයිඩ්ය
4. R 134 සහ R 1600 ය.

(09) කුඩා දරුවන්සඳහා නිර්මාණයක්සැකසීමේදීසැලකිලිමත්විය යුත්තේ,
1. ක්‍රීඩා භාණ්ඩ වීදුරුවලින් නිම කිරීම වැදගත්ය.
2. කැපුම්තලය වැනි අනාරක්ෂිත කොටස් ආවරණය කර තිබීම වැදගත්ය.
3. ශරීරයට හානිකර තීන්ත වර්ග භාවිතා කර තිබීම.
4. දරුවන්ගේ වයස පිළිබඳ නොසලකා හැරීම.

(10) ආහාර ආශ්‍රිත නිෂ්පාදනයක් ආරම්භ කිරීමේදී නිෂ්පාදන පිරිවැය අඩු වීම හා ලාභ ලබා ගැනීම සඳහා වඩාත් වැදගත් කරුණක් විය හැක්කේ,
1. තමාගේ රුචිකත්වය අනුව ආහාර තෝරා ගැනීම
2. ගබඩා කර ගැනීමට පහසු ආහාර තෝරා ගැනීම
3. ප්‍රදේශයේ සුලබව පවතින අමුද්‍රව්‍ය යොදා ගැනීම
4. ආනයනික අමුද්‍රව්‍ය යොදා ගැනීම

(11) ආහාර නිෂ්පාදනයක් කිරීමට සැලසුම් කිරීමේදී පරිරක්ෂණ ක්‍රමයක් යොදා ගැනීම අනිවාර්ය වේ. එවැනි පරිරක්ෂණ ක්‍රමයක් වනුයේ,
1. ලුණු හෝ සීනි යෙදීම
2. කිරි මිශ්‍ර කිරීම
3. රසකාරක යෙදීම
4. මුහුන් යොදා ගැනීම

(12) ආහාරයක් විවිධ මුහුණුවරකින් වෙළඳපොළට ඉදිරිපත් කිරීම හඳුන්වන්නේ,
1. ආකර්ෂණය ඇති කිරීමයි
2. ආහාර විවිධාංගීකරණයයි
3. උත්තේජනය ඇති කිරීමයි
4.ඇසුරුම්කරණය යි.

(13) ආහාර ඇසුරුමක් සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුත්තේ,
1. ඇසුරුම සඳහා පොලිතීන් යොදා ගැනීම
2. ඇසුරුම සඳහා ප්ලාස්ටික් යොදා ගැනීම
3. ඇසුරුම සඳහා පරිසර හිතකාමී ස්වභාවික අමුද්‍රව්‍ය යොදා ගැනීම.
4. ඇසුරුම සඳහා සජුෆෝම් යොදා ගැනීම

(14) මිනිස් අවශ්‍යතා ඉටුකිරීමට මැදිහත්ව සිටින විවිධ ව්‍යාපාර අපට දක්නට ලැබේ. ඒවා පරිමාණය අනුව වර්ගකළ හැක්කේ,
1. කුඩා, මධ්‍යම හා මහා පරිමාණ ව්‍යාපාර වශයෙනි.
2. භාණ්ඩ, සේවා, සිල්ලර ව්‍යාපාර වශයෙනි.
3. දේශීය,විදේශීය, බහුජාතික ව්‍යාපාර වශයෙනි.
4. කෘෂි, ආහාර, සේවා, ව්‍යාපාර වශයෙනි.

(15) වෙළඳපොළට පිවිසෙන නවක ව්‍යවසායකයෙකු සඳහා වඩාත් යෝග්‍ය වන්නේ,
1. මහා පරිමාණ ව්‍යාපාරයක් ඇරඹීම
2. කුඩා ව්‍යාපාරයක් ඇරඹීම
3. මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ඇරඹීම
4. හවුල් ව්‍යාපාරයක් ඇරඹීම

(16) (Covid 19) කොරෝනා වසංගතය හමුවේ අලුතින්බිහි වූ ව්‍යාපාර අවස්ථාවක් වන්නේ,
1. පාසල් ලිපිද්‍රව්‍ය අලෙවිය
2. පාවහන් නිෂ්පාදනය
3. ඇඟලුම් නිෂ්පාදනය
4. මුව ආවරණ හා විෂබීජ නාශක නිපදවීම හා අලෙවිය.

(17) බැංකු සේවාවක්නොවන්නේ,
1. මුදල් තැන්පතු භාර ගැනීම
2. ණය මුදල් ලබා දීම
3. ලීසිං පහසුකම් ලබා දීම
4. චෙක්පත් භාවිතයට ඉඩ නොදීම

(18) සාර්ථක ව්‍යවසායකයෙකු සතු නායකත්ව ගති ලක්ෂණය තුළ දැකිය හැක්කේ,
1. කාර්යක්ෂමව කටයුතු නොකිරීම,
2. අන් අයගේ අදහස් ලබා නොගැනීම.
3. සුහදශීලී ලෙස ඇහුන්කම් දීම
4. වගකීමෙන් තොරවීම.

(19) ව්‍යාපාර ආධාර ධර්මයක් වන්නේ,
1. ව්‍යාපාර සඳහා පවතින නීතිරීති ගැන සැලකිලිමත් නොවීම
2. සාධාරණ හා සත්‍යවාදීව ව්‍යාපාර කටයුතු කිරීම
3. අනිකුත් තරගකරුවන්ට හානි කිරීම.
4. ව්‍යාපාර මගින් බැහැර කරන අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම

(20) දකුණු පළාතට සුවිශේෂී වූ ආහාර වර්ගයකි.
1. තල්
2. ස්ට්‍රෝබෙරි
3. මී කිරි
4. රතුළුණු

## II කොටස

පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.

(1) i. කොම්පෝස්ට් දියර පොහොර සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය දෙකක් නම් කරන්න (ල.2)
ii. වගාව සඳහා කාබනික පොහොර භාවිතයෙන් අත්වන වාසි තුනක් නම් කරන්න. (ල.3)
iii. මුකුණුවැන්න ඉත්තකින් සිටුවීම සඳහා සකස් කර ගත හැකි දඬු වර්ග තුන නම් කරන්න. (ල.3)
iv. පාංශු සංරක්ෂණ ක්‍රම තුනක් නම් කර ඉන් එක් ක්‍රමයක් සරලව පැහැදිලි කරන්න. (ල.5)
v. සීමිත ඉඩකඩක් සඳහා සුදුසු වගා ක්‍රම හතරක්නම් කරන්න. (ල.4)

(2) i. සෞඛ්‍යාරක්ෂිත ලෙස ආහාර සකස් කිරීමේදී පුද්ගල සනීපාරක්ෂාව පවත්වා ගැනීම සඳහා අනුගමනය කළයුතු කරුණු හතරක් ලියන්න. (ල.5)

ii. ආහාරවල අඩංගු පෝෂණ සංඝටක පහ නම් කර එක් එක් සංඝටකය සඳහා ආහාර වර්ග දෙක බැගින් නම් කරන්න. (ල. 5)

(3) i. කුඩා පරිමාණ ව්‍යාපාරිකයින්ට වැදගත් වන ආයතන හා සැලසෙන සේවා ගැලපෙන පරිදි යා කරන්න.

| | |
|---|---|
| 1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | A මෝස්තර නිර්මාණ තොරතුරු ලබා ගැනීම සඳහා |
| 2. බැංකු හා මූල්‍ය ආයතන | B ඇසුරුම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා |
| 3. වෘත්තීය පුහුණු අධිකාරිය | C ලියාපදිංචි කිරීම හා නීති රීති දැන ගැනීම |
| 4.ජාතිකමෝස්තර මධ්‍යස්ථානය | D සේවක පුහුණු වීම් සිදු කිරීම |
| 5.ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය | E ණය පහසුකම් ලබා ගැනීම හා වෙනත් ගණුදෙනු සඳහා |

(ල.5)

ii. කුඩා ව්‍යාපාරකයන්ගේ වෙළඳපොළ තම ප්‍රදේශයට සීමාවන බැවින් ඔහු තෝරාගතයුතු ප්‍රචාරණ මාධ්‍ය තුනක් නම් කරන්න. (ල.5)

(4) ගෘහස්ථ ඉන්ධනයක් ලෙස භාවිත වූ ගෑස් හිඟවීමේ ගැටලුව පසුගිය සමයේ ප්‍රබලව දක්නට ලැබිණි.

i. ඉන්ධනයක් ලෙස ගෑස් වෙනුවට භාවිතයට ගත හැකි විකල්ප ඉන්ධන 02ක් නම් කරන්න. (ල. 5)

ii. වැඩපහසු කිරීමේ උපකරණ 03ක් නම් කරන්න. (ල.5)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

| 9 ශ්‍රේණිය | ප්‍රායෝගික තාක්ෂණ කුසලතා | පිළිතුරු පත්‍රය |
|---|---|---|

I කොටස

(1). 2
(2). 4
(3). 2
(4). 1
(5). 4
(6). 2
(7). 3
(8). 4
(9). 2
(10). 3
(11). 1
(12). 2
(13). 3
(14). 1
(15). 2
(16). 4
(17). 4
(18). 3
(19). 2
(20). 3

## II කොටස

(1) i කොම්පෝස්ට්, රතු සීනි, ටින් මාළු, ජලය (ල.2)

ii වසවිෂ වලින් තොර ආහාර ලබා ගත හැකිවීම.
පාංශු ජීවීන්ට හිතකර වීම.
පසේ තෙතමනය ආරක්ෂා වීම.
ශාකයට අවශ්‍ය පෝෂක ගබඩාවක් ලෙස ක්‍රියා කිරීම. (ල. 6)

iii දළ දඬු, අඩ දළ දඬු, ළා දඬු (ල. 3)

iv වන වගාව, කෘෂි වන වගාව, බෑවුම් වගා භූමිවල සමෝච්ඡ කානු යෙදීම, බෑවුම් වගා භූමි හෙල්මලු ක්‍රමයට සකස් කිරීම, සමෝච්ඡ රේඛා මත රනිල ශාක දෙවැටි යෙදීම, පාංශු පුනරුත්ථාපන ශාක සිටුවීම, ආවරණවගා යෙදීම (ල.5)

v වගා ඉනිමං, වගා කූඩ, වගා රාක්ක, වගා කුළුණු (ල. 4)

(2) i ක්‍රමවත් ලෙස අවශ්‍යතාවය අනුව දෑත් සේදීම
පිරිසිදු නිල ඇඳුම් ඇඳීම
සුදුසු හිස් ආවරණ පැළඳීම
මුව ආවරණ පැළඳීම
අත් වැසුම් හා පා ආවරණ පැළඳීම
ආහාර සකස් කරන අතරතුර ආහාර නොගැනීම
දුම් පානය නොකිරීම
ආභරණ ඔරලොසු භාවිත නොකිරීම (ල.5)

ii කාබෝහයිඩ්‍රේට්
ප්‍රෝටීන්
ලිපිඩ
විටමින්
ඛනිජ ලවණ

සුදුසු පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ල.5)

(3) i 1 - C
2 - E
3 - D
4 - A
5 - B (ල.5)

ii පෝස්ටර්
බැනර්
අත් පත්‍රිකාව
ගෙයින් ගෙට ගොස් නිෂ්පාදන හඳුන්වා දීම.
ශබ්ද විකාශන යන්ත්‍ර (ල. 5)

(4) i දර, භූමි තෙල්, ලීකුඩු, දහයියා, පොල් කටු අඟුරු (ල.5)

ii මකුළු දැල් කඩන යන්ත්‍රය
ජල විසිරකය
ආහාර ඇඹරුම් යන්ත්‍රය
විදුලි බත් පිසිනය
රෙදි සෝදන යන්ත්‍රය
බිම ඔප දමන යන්ත්‍රය (ල.5)